## පෙරදිග සංගීතය - 7 ශ්‍රේණිය (සාමාන්‍ය පාඩම) - 2 වාරය - XI

## කෝලම් ගීත




- පහතරට පධාන ජන නාට්‍ය වේ. ( ගැමි නාට්‍යයකි)
- වෙස් මුහුණු භාවිතා කරමින් රංගනයේ යෙදේ.
- කෝලම් නාට්‍ය යේ සියළුම චරිත පිරිමින් විසින් රඟ පානු ලැබේ.
- හාස්‍ය රසය ජනිත කරවන මෙම නාට්‍ය රාත්‍රි කාලයේ රඟ දක්වයි.
- පධාන වාද්‍ය භාණ්ඩය පහතරට බෙරයයි. හොරණෑව හා සර්පිනාවද භාවිතා කරයි.
- සබයට එන සියළු චරිත හඳුන්වා දෙන්නේ සබේ විදානේ විසිනි.
- ගීත ගායනය අදාළ චරිත විසින්ම සිදු කරයි. උදා: ජස ලෙංචිනා කෝලම, මුදලි කෝලම, අණබෙර කෝලම
- රංග භූමිය සඳහා එළිමහන් ස්ථානයක් තෝරා ගනී. එය තානායම්පොළ නම් වේ.
- චරිත හාස්‍යයට හා උපහාසයට ලක් කිරීම කෝලම් වලින් සිදුවේ.

### සබේ විදානේ විසින් ජසයාගේ පැමිණීම අරහයා ගැයෙන ගීතයක්

ගම්භීර කාලිංග නුවර නිරිඳුගෙ වාසල තුළයට

ඉන්න දනා සේම රජුට සෝදා පට පිළී සොදට

ඉන් නරනා තැබූ නම මට පේඩි විදානේ සත්තට

මං මෙතනට ආමි වියන් බඳිනට නරනිඳු එන විට

### ජසයා සබයට පැමිණීමෙන් පසු ගයන තවත් ගීතයක්

ගම්වල හැම තැන ඇවිද ගොසින්නේ - වෙල්ලාවට රෙදි අසුරා ගන්නේ

සොද සොද පිරුවට වියන් බඳින්නේ - පේඩි හමාවද සබේ නටන්නේ

### ලෙංචිනා සබයට පැමිණීමෙන් පසු ගයන ගීතයක්

මං වගෙ පේඩි කතක් මනා - දුටුවා ද ලොවේ රුසිරෙන් දිනා

මං කළ පෙර පවකින් මනා - මට හිමි වුණේ මහලු වූ වෙසමුණා

මවුපියො නිදහස් වෙන්නටා - මාව දුන්නයි නාකි වූ හමෙකුටා

පැවරුම : පහත කෙටි පශ්න වලට පිළිතුරු සපයන්න.

01. කෝළම් පවලිත වන්නේ ලංකාවේ කිනම් පළාතකද?
02. කෝළම් රංග සම්පදායේ දක්නට ලැබෙන ලක්ෂණ ලියා දක්වන්න.
03. මෙම රංග ශෛලිය සඳහා භාවිතා වන වාද්‍යා භාණ්ඩ මොනවාද?
04. කෝළම් රග දක්වන එළිමහන් රංග භූමිය කුමන නමකින් හදුන්වයිද?